

'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු

| 57 වන කාණ්ඩය | බු.ව. 2558 වෙසක් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2014 මැයි මස 14 | 01 වන කලබ |
|---|---|---|

# වෙසක් පිදුම

දුප්පතකු ගෙ දුක් කඳුළු නිවන්නේ
කො තැන ද ඒ තැන යි බුදුන් පිදෙන්නේ
කොහි ද අනුන් හට සුවය පතන්නේ
ඒ සිතේ මල් බුදු පුදට පිපෙන්නේ
කෙදින ද මේ ගැන මඳක් සිතන්නේ
ඒ දිනයි හද ගඳකිළියක් වන්නේ

- අනඳ



# බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම මාර්ග දේශකයාණෝයි

**පණ්ඩිත අතිගරු ගණේගම සරණංකර**
**නායක මාහිමිපාණන් වහන්සේ**

තථාගතවරයෝ වනාහි මාර්ගදේශකයෝ ''අක්ඛාතාරො තථා ගථා'' යැයි බුදුන්වහන්සේ විසින් ම වදාරණ ලදී. මග්ගඤ්ඤු මග්ගවිදූ මග්ගකොවිදෙ, යන නම් වලින් බුදුවරු හඳුන්වනු ලබති. නියම මාර්ගය, ආර්ය මාර්ගය දත් තැනැත්තා යනු එම තේරමයි. මේ නියම මාර්ගය නම් දුකින් මිදීමේ මාර්ග යයි. නිවන් මගයි. බුද්ධඥානයෙන් සොයාගත් මගයි. මිනිසෙකු විසින් යායුතු මගයි. ඒ මග ගමන් කළ කිසිවෙකුට කිසි විටක වැරදී නැත. බුදුහාමුදුරුවන්ට ඕනෑ කළ එක ම දෙය නම් නොමගයන ලෝකයා හරි මගෙහි ගමන් කරවීමයි. මෙ හරිමග නම් ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි. අංග අටකින් යුත් මේ මගෙහි ගමන් කරන්නා ගේ ප්‍රතිපදාව මධ්‍යම ප්‍රතිපදාවයි. සීමා නොයික්ම වූ මැදුම් පිළිවෙතයි. සම්මා දිට්ඨි - හරි දැකීම, සම්මා සංකප්ප - යහපත් කල්පනාව, සම්මා වාචා - යහපත වචනය, සම්මා කම්මන්ත - යහපත් වැඩ, සම්මා ආජීව - යහපත් දිවි පෙවෙත, සම්මා වායාම - යහපත් වෑයම, සම්මා සති - යහපත් සිහිය, සම්මා සමාධි - යහපත් ලෙස සිත එකඟකර ගැනීම යන මේ අංග අටකින් යුත් ශ්‍රේෂ්ඨතම මාර්ගය බුදුරදුන් විසින් සොයා ගන්නා ලදී.

ඉහත සඳහන් අති උතුම් මාර්ග අටෙන් එක මගක් වුවත්

ගමන් කළොත් ඔහු මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ මනුෂයෙක් වෙයි. මේ අට ම පිළිපැද්දෙත් ඔහු මිනිසුන්ට පමණක් නොව දෙවි බඹුන්ටත් වඩා උතුම් මනුෂ්‍යයෙක් වෙයි. බුදුන් වහන්සේ අපට පෙන්වා දුන්නේ ''හොඳ මේවා ය, නරක මේවා ය, කුසල් මේවා ය, අකුසල් මේවා ය, කළ යුතු දේ මේවා ය, නොකළ යුතු දේ මේවා ය, ගතයුතු දේ මේවා ය, නොගත යුතු දේ මේවා ය, පිළිපැදිය යුතු දේ මේවා ය, අත්හළ යුතු දේ මේවා ය, හොඳ කළොත් මේ මේ විදියේ හොඳ විපාක ලැබේ ය. මා මෙසේ කියන්නේ නිකම්ම නොවේ. අත්හද බැලීමෙන් ය. පළපුරුද්දෙන් ය. එම නිසා හොඳ දේ කරන්න. නරක දේ අත්හරින්නැ''යි කියා ය. ආදරණීය පියෙකු මෙන්, දයාබර මෑණියකෙනෙකු මෙන්, කාරුණික අනුශාසකයෙකු මෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට හොඳ මග, හරි මග, නියම මග පෙන්වා දුන්හ. එබැවින් උන්වහන්සේ ශ්‍රේෂ්ඨතම මාර්ග දේශකයාණෝ යි.

මේ උතුම් මාර්ග දේශකයාණන්ගෙන් අප ප්‍රයෝජන ගත යුත්තේ කෙසේ ද? එතුමන්ට වැඳ වැඳ සිටීමෙන් ද පුද පුද සිටීමෙන් ම ද? එතුමන් ගේ විශාල ප්‍රතිමා තැනවීමෙන් ද? නැතහොත් එතුමන් ඇඟිල්ල දික්කොට පෙන්නූ හරි මගෙහි ගමන් කිරීමෙන් ද? උන්වහන්සේ නිවන් මග පෙන්වා දීම ගැන අපි උන්වහන්සේට සද ණයගැති වෙමු. ඉහත සඳහන් ගරු බුහුමන් පුද පූජා උන්වහන්සේ වෙනුවෙන් අප කළ යුතු ය. එයින් අපට පින්සිදු වේ. එහෙත් ඒ ආමිස පූජා පමණක් නිවන් දැකීමට ප්‍රමාණවත් නොවේ. නිවන අප ළඟ ඇති දෙයකි. එය අප විසින් ම ලබාගතයුතු දෙයකි. අප විසින් ම සොයා ගත යුතු දෙයකි. කාගෙවත් පිහිටෙන් ලබාගත හැකි දෙයක් නොවේ.

බුදුන්වහන්සේ ඇත්ත වශයෙන් ම බලාපොරොත්තු වූයේ විශාල ගෝල බාල පිරිසක් තනාගෙණ, ඔවුන් පිරිවරාගෙන

මහා අධිපතියෙකු මෙන් ජීවත්වීමට නොවේ. මිනිසෙකුට විඳිය හැකි අන්තිම ඉහළම දුක් විඳ සොයාගත් ඒ ශ්‍රේෂ්ඨ මාර්ග යෙහි - ඒ විසුද්ධි මාර්ගයෙහි - ඒ නියම මගෙහි ගමන් කරණ පිරිසකි. උන්වහන්සේ අනුව යන, අනුගමනය කරන පිරිසකි. උන්වහන්සේ සිතූ හැටියට සිතන පිරිසකි. උන්වහන්සේ වැඩ කළ හැටියට වැඩ කරණ පිරිසකි. උන්වහන්සේ කථාකළ හැටියට කථා කරණ පිරිසකි. උන්වහන්සේ පිළිපැද්ද හැටියට පිළිපදින පිරිසකි. කොටින් ම උන්වහන්සේ කී දේ අසා සිටින පිරිසක්වත්, එය ලියා තබාගෙන කටපාඩම් කරමින් සිටින පිරිසක්වත්, එයට වැඳ වැඳ සිටින පිරිසක්වත් නොව, කී දේ කරණ, අත්හදා බලන ක්‍රියාවේ යොදන පිරිසකි. බුදුරදුන් පෙන්වූ මාර්ගයෙහි නොගොස් උන්වහන්සේ ගේ නාමයට, උන්වහන්සේ ගේ රූපයට ගරු කර කර සිටීමෙන් පමණක් නිවන් දැකිය නොහැකි ය.

අපි උදාහරණයක් ගෙන බලමු. මරදානේ දුම්රියපොළට පැමිණි අයෙක් එහි සිටි කෙනෙකු ගෙන් නිදහස් මන්දිරයට යන්නේ මොන පාරෙන් දැයි අසයි. එහි සිටි තැනැත්තා අසවල් අසවල් පාරෙන් යයි යායුතු මග කියා දෙයි. එවිට මාර්ගය ඇසූ තැනැත්තා මාර්ගය පෙන්වා දුන් තැනැත්තාට වඳිමින්, පුදමින්, ගරු කරමින්, ස්තුති කරමින් එතැන ම සිටියොත් හෝ එහි නොගියොත් හෝ නිදහස් මන්දිරයට ගියා වන්නේ නැත. නිදහස් මන්දිරය දැකගන්නේ නැත. ඔහුට ස්තුති කොට, පෙන්වූ මාර්ගයෙහි ම යායුතු ය. නිදහස් මන්දිරියට යැවෙන්නේ ඔහු පෙන්වූ මාර්ගයෙහි ගමන් කොළොත් පමණකි. බුදුන් වහන්සේ අපට පෙන්වූ මාර්ගයෙහි ගමන් කොළොත් පමණකි. බුදුන් වහන්සේ අපට පෙනුවූ ආර්ය මාර්ගය දුම්රිය පොළේ සිටි තැනැත්තා නිදහස් මන්දිරියට යෑම සඳහා පෙන්වූ මාර්ගයට වඩා දහස් ගුණයකින් උතුම් මාර්ගයකි. ඒ ශ්‍රේෂ්ඨ මාර්ගය ඒ උතුම් නිවන් මග පෙන්වා දුන් උතුමාට දවසට තුන්වරක් වුවත් වැඳිය යුතු ය. පිදිය යුතු ය. ගරු කළ යුතු ය. එහෙත් නිවන්

දැකීමට, නිවණට යෑමට, ඒ උතුම් තත්ත්වය ලබා ගැනීමට වැඳීම්, පිදීම්, ගරුකිරීම්, වැනි ආමිස පූජා පමණක් ප්‍රමාණවත් නොවේ. උන්වහන්සේ පෙන්වා දුන් මාර්ගය හැර වෙන කිසි ම මගක් නිවන් දැකීමට නම් නැත. අනිවාර්යයෙන් ඒ මගෙහි ම යායුතු ය.

එයට හොඳ නිදසුනක් මෙන්න. ''බුදුන් වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහි වැඩ සිටිද්දී පෘථග්ජන භික්ෂූහු හඬා වැලපෙන්නට වූහ. කෙලෙස් රහිත භික්ෂූහු තුෂ්ණිම්භූතව සංස්කාර ස්වභාවය සිතමින් සිටියහ. මේ අතර ධම්මාරාම නමැති භික්ෂු නමක් 'අපේ බුදුහාමුදුරුවන් වහන්සේ අන්තිම හුස්ම හෙලන්නට පෙර මම කොහොම හරි ඒ උතුමා දුන් අවවාදයක් අනුව පිළිපැදල කිසියම් ප්‍රතිඵලයක් ලබාගණිමි'' යි ඉටා ගෙන පැත්තකට ගොස් හුදෙකලාව භාවනා කොට චිත්තපාරිශුද්ධිය ලබාගත්තේ ය. ස්වකීය මහාකාරුණික ගුරුවරයා අන්තිම හුස්ම හෙලද්දී ඒ ගැන කිසිදු හැඟීමක් නැති ව පැත්තකට වී සිටි ධම්මාරාම භික්ෂු නම දුටු අඬා වැළපෙමන් සිටි අනෙක් භික්ෂූහු එතැනට පැමිණ ඔහුගේ අතින් අල්ලාගෙන, ''අපේ අමා මෑණියන් අප අත්හැර සඳහට ම අපෙන් වෙන්ව යද්දී මේ මහණාට පමණක් කිසිම ශෝකයක් දුකක් නැත. මොහු හිතක් පපුවක් නැත්තෙකැ'යි බුදුහාමුදුරුවන් ලඟට ඇදගෙන ගියහ. පිරිනිවන් මඤ්චකයෙහි වැඩසිටි බුදුහු තමන් ලඟට අකැමැත්තෙන් භික්ෂුනමක් ඇදගෙන එනු දැක ''කුමක් නිසා භික්ෂුනමක් ඇදගෙන එන්නහුද''යි ඇසූහ. එවිට අනික් භික්ෂූහු ''අනේ ස්වාමීනී, ඔබ වහන්සේ පිරිනිවන් පාන්නට සුදානම් ය. ඔබ වහන්සේ නැතුව අපට ජීවත්වීමෙන් පලක් නැත. අප කාගේ මුහුණ බලා සැනසෙන්නද? මින්පසු අපට හද පිරුණු කරුණාවෙන් අවවාද අනුශාසනා කරන්නේ කවුද? ඒ නිසා අපට ඇති ශෝකය හා දුක අප්‍රමාණ ය. එහෙත් මේ භික්ෂු නමට පමණක් කිසිම දුකක් හෝ ශෝකයක් හෝ නැත. පැත්තකට වී බිම බලාගෙන බුම්මාගෙන සිටිනවා.

එබැවින් අපි මොහු ඔබ වහන්සේ ළඟට ඇදගෙන ආවෙමු''යි කී හ. බුදුහු ''මොවුන් කියන දේ සැබෑද''යි භික්ෂුනමගෙන් ඇසූහ. එහෙයි ස්වාමීනි, මම මොවුන් මෙන් කිසි පලක් නැති හඬා වැලපීම් නො කොට, පැත්තකට වී ඔබ වහන්සේ දුන් රන් අගනා උපදෙස් වලින් එකක් අනුව පිළිපැද, ඔබ තුමන් ඇස් දෙක පියාගන්නට මත්තෙන්, ඔබ තුමන්ගේ ඇස් හමුවේ දී ම එයින් ප්‍රයෝජන ගනිමියි ඉටා ගත්තෙමි. මගේ ඒ අධිෂ්ඨානය, මගේ ඒ උත්සාහය අතිශයින් ම සාර්ථකයි. මම දැන් මොවුන් මෙන් හඬා වැලපෙන බොළඳ තත්ත්වය ඉක්මවා සිටින්නෙක්මි''යි කීය. ඔහු කෙලෙස් ප්‍රහීණ කළ රහත් භික්ෂුවක් ව සිටින බැව් දැනගත් බුදුහු පිරිනිවන් මඤ්චකයෙහි වැතිරී සිටි අයුරින් ම සිටගෙණ දෑත එක්කොට සාධු! සාධු!! සාධු!!! යයි තුන්වරක් සාධුකාර දී, හඬා වැලපෙන භික්ෂූන් අමතා ''මහණෙනි, මා වෙනුවෙන් හඬා වැලපෙන තෙපි මට හැබෑ ආදරය හා ගෞරවය ඇත්තෝ නොවහු. මගේ එක වචනයක් අනුව පිළිපැද ඉන් ප්‍රයෝජන ගත් මෙන්න මේ භික්ෂුවයි මට සැබෑ ආදරය හා ගෞරවය ඇත්තේ. මට සැබැවින් ම ගරු කරන්නන් මගේ වචනයට ගරු කළ යුතු ය. මගේ වචනයට ගරු කිරීම නම් එය රන් පත් ඉරුවල, රිදී පත් ඉරුවල, සෙල්ලිපි වල ලියාගෙන ආරක්ෂා කරගෙන සිටීම හා ඒවාට වඳිමින්, පුදමින් සිටීම පමණක් නොව ඒ වචන අනුව, ඒ අවවාද අනුව පිළිපැදීමයි. ඒවා ක්‍රියාවෙහි යෙදවීමයි. ඒ උපදෙස් අනුව ජීවිතය සකස් කර ගැනීමයි.''

**සුවඳ මලින් පමණක් මා පුදන්නෝ මා නිසිලෙස පුදන්නෝ නොවෙති. ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි යෙදෙන්නෝ ම මා නිසි ලෙස පුදන්නාහු නම් වෙති." "න හි මයිහං මාලාගන්ධාදීහි පූජං කරොන්තා මම පූජං කරොත්තී නාම. ධම්මානුධම්මං පටිපජ්ජන්තා පන මං පූජෙන්තී නාම.''**

**(ධම්මපදට්ඨ කථා - ධම්මාරාම වත්ථු)**

ඉහත සඳහන් කථාවෙන් බුදුහාමුදුරුවන් වහන්සේ කවරෙක් ද යනුත්, උන්වහන්සේ ගේ බලාපොරොත්තු කුමක් ද යනුත් අපට මනාව වටහාගත හැකි ය. උන්වහන්සේ බලාපොරොත්තු වූයේ එතුමන් ගේ දිලිසෙන සිරුරුට හෝ රූපශ්‍රීයට හෝ මිහිරි කටහඬට හෝ මහන්තත්වයට හෝ නායකත්වයට හෝ අනූපම පෞරුෂත්වයට හෝ වසීවුනු, අන්ධානුකරණයෙන් හා අන්ධභක්තියෙන් වෙලුනු දහස් ගණන් ගෝලබාල පිරිසක් වටකර ගෙන ඔවුන් ලවා වැඳුම්, පිදුම්, ගරු බුහුමන් කරවා ගැනීම නොවේ. විරාභිවාදනය කරවා ගැනීම නොවේ. ඔවුනට අවවාද කරමින්, අණ දෙමින්, ඔවුන් යටත් කරගෙන, වසඟ කරගෙන, කීකරු කරගෙන නායකත්වය හුවාදක්වීම නොවේ. ධර්මය අනුව පිළිපදින, ධර්මය අත්හද බලන, ධර්මය ජීවන ක්‍රමය - ජීවන මාර්ගය කොට සලකන, ප්‍රතිපත්තියට දිවිදෙන, ඍජුත්තවයට තැන දෙන, නීතියට ගරු කරන, සත්‍යයට යුක්තියට ගරුකරන, ඉදිරියට යන, නොපසුබසින, නිර්භීත, ධෛර්යවත්, සිල්වත්, ශිෂ්ට සමාජයක් ගොඩ නැංවීම යි උන්වහන්සේ බලාපොරොත්තු වූයේ. ඒ සමාජයේ උසස් ම පිරිස භික්ෂු පිරිස යි. උතුම් පරමාර්ථ පිට සකස් කළ මේ පිරිස පෞද්ගලිකත්වය සහමුලින් ම අත්හළ පොදු බවේ මූර්තිහු වූහ. ගෘහ බන්ධන ආදී හැම ආශාවක්ම දුරු කළ අය වූහ. පියාපත් බර පමණක් ඇති පක්ෂීන් මෙන් ''**සපත්තභාරො පක්ඛිසකුණා විය**'' සිතු සිතු තැන යා හැක්කෝ වූහ. එද උන්වහන්සේ පසු පස ගියේ, අනුගමනය කෙළේ ශිෂ්ටත්වයේ මූර්තීන් බඳු පිරිසකි.

බුදුන්වහන්සේ තමන්ට තබා තමන් දෙසූ ධර්මයටවත් අනවශ්‍ය ගරු සැලකිලි පුද පූජා හා මමත්වයක් දක්වීම අනුමත නොකළහ. **කුල්ලූපමං වො භික්ඛවේ ධම්මං දෙසිස්සාමි. නිත්ථරණත්ථාය නො ගහණත්ථාය.**'' මහණෙනි තොපට මම පහුරක් උපමා කොට ධර්මය දෙසන්නෙමි. එය එතරවීම පිණිස ය. කර තබා ගෙන යෑම, ආරක්ෂාකර ගැනීම පිණිස

නොවේ. මට මේ පහුර බොහෝ උපකාරී විය. මම මේ පහුර නිසා එගොඩ වීමි''යි සිතා එය හිස උඩ තබාගෙන හෝ කර ගහගෙණ යන්නෙමැ යි සිතතොත් එය බුද්ධිමත් සිතිවිල්ලක් නොවේ. එපරිද්දෙන් ම මා දෙසූ ධර්මය ද සසරින් එතරවීම පිණිස මිස, කර තබාගෙන යාම පිණිස නොවේ. ''**බහුකාරෙ වො මේ අයං කුල්ලො යන්නූනාහං ඉමං කුල්ලං සීසෙ වා ආරොපෙත්වා ඛන්ධෙ වා උච්චරෙත්වා යෙන කාමං පක්කමෙය්‍යං**''

**(මජ්ඣිම නිකාය - අලගද්දූපම සූත්‍රය)**

එසේ ම බුදුන්වහන්සේ දෙසූ ධර්මය පොත්වල ලියා ගෙන අල්මාරිවල තැන්පත් කොට පුද පූජා පැවැත්වීම පිණිස හෝ සඟවාගෙණ තබාගැනීම් පිණිස හො නොව, හැම දෙනාටම කියවන්නට සලස්වා හැකි තරම් ප්‍රචාරය කිරීම කළයුතු බව උන්වහන්සේ ගේ හැඟීමයි. '' **තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්ම විනයො විවටොව විරොචති. නොපටිඡන්නෝ** "- " **මහාණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූ තරමට බබලයි. වැසී තිබෙන තරමට නොම බබලයි.**''

**(අංගුත්තර නිකාය - තිකනිපාත කරණුඩු වග්ග- 9 සූත්‍රය)**

මේ කරුණු වලින් පෙනී යන්නේ බුදුරදුන්ට ඕනෑ කළේ මාර්ග දේශකයකු මෙන් පෙනී සිට ලෝකයාට නියම මාර්ගය පෙන්වීමයි. ලෝකයා නියම මාර්ගයේ ගමන් කරවීමයි. එසේ නැතුව ලෝකයාගෙන් පුද සත්කාර ලබා ගැනීම නොවේ. ලෝකයාගෙන් ලැබෙන ගරු බුහුමන් ගැන හෝ නින්ද අපහාස ගැන හෝ උන්වහන්සේ කිසි විටක කිසිදු තැකීමක් නොකළහ.

**බුද්ධං සරණං ගච්ඡාමි** යන්නෙහි නියම තේරුම බුදුන් අනුව යමි. බුදුන් අනුගමනය කරමි. බුදුන් ගිය මග යමි යනුයි. බුදුහාමුදුරුවෝ මෙයට අවුරුදු දෙදහස් පන්සිය තිස් දෙකකට (2532ට) පෙර පිරිනිවන් පෑහ. අද ජීවතුන් අතර නැති

කෙනෙකුගෙන් පිහිට ඉල්ලන්නේ කෙසේ ද? ඉල්ලීමෙන් ඇති ඵලය කුමක් ද? අද නැත උන්වහන්සේගෙන් ගතහැකි එක ම පිහිට, එක ම සරණ, එක ම ප්‍රයෝජනය නම් උන්වහන්සේ දුන් අවවාද පිළිපැදීමයි. දුක සේ සොයාගත් සත්‍යය අවබෝධකර ගැනීම යි. එසේ නොකොට වෙන කුමක් කළත් නියම හැටියට බුදුන් සරණ ගියා වන්නේ නැත.

**ධම්මං සරණං ගච්ඡාමි** යන්නෙහි නියම තේරුම ධර්මය අනුව පිළිපැදීම් යනුයි. ධර්මය පුද්ගලයෙක් නොවේ. ද්‍රව්‍යයක් ද නොවේ. එයින් ලබාගත හැකි එක ම ප්‍රයෝජනය නම් ඒ අනුව පිළිපැදීමයි. **සංඝං සරණං ගච්ඡාමි** යන්නෙහි නියම තේරුම නම් සංඝයාගේ අවවාද අනුශාසනා පිළිපදිමි. සංඝයා අනුව යමි. සංඝයා සතු උතුම් ගුණධර්ම තමන් තුළත් ඇති කර ගනිමි.'' යනුයි. සංඝයා සරණ ගියා වන්නේ එවිටයි.

කල් යත් ම බෞද්ධයෝ බුදුන් වහන්සේගෙන් ඈත් වෙති. බොහෝ දෙනාට උන්වහන්සේ ගැන නියම අවබෝධයක් හැබෑ ඇදීනීමක් නැත. වැරදි අවබෝධයෙන් යුක්තව, අන්ධ භක්තියෙන් යුක්තව උන්වහන්සේ ඇදහීමෙන් ගතයුතු නියම පල ගත නොහැකි ය. බෞද්ධයකු ගේ ප්‍රධානතම යුතුකම බුදුන්වහන්සේ කවරෙක් දැයි හරි හැටි දැන හැඳින ගැනීමයි. බුදුහාමුදුරුවන් ගැන සැබෑ අවබෝධයක් නැති කිසිවෙකුට හැබෑ බෞද්ධයකු විය නොහැකි ය. එබැවින් මෙතෙක් කල් ලොව උපන් ශ්‍රෙෂ්ඨතම මාර්ගදේශකයා වූ බුදුන් වහන්සේ අපට පෙන්වා දී ඇති විශුද්ධි මාර්ගයෙහි - අතිපරිශුද්ධි මාරග යෙහි - ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ගමන් කරන්නට හැම උත්සාහයක් ම දැරිය යුතු ය.



# Vesak

Today is the day that, years ago,
A prince was born to take the royal throne.
Kind and caring, handsome and charming,
He grew with divine character.
But puzzled He was with the world He knew,
And set out on a journey.

Today is the day, years ago,
That a leader was awakened,
Enlightened with the answers of the world.
To show the path out of worldly suffering,
He spread his acquired wisdom.
And the years and lifetimes of understanding he had earned,
He selflessly gave to the world.

Today is the day that, years ago,
Buddha, who'd be remembered eternally,
Peacefully left the world.
And until this day His teachings live
To light the way towards ecstasy.

**Chathuri Wickramaratne**
Dulles High School
Houston, TX, USA



# වර්තමාන ලෝකයට බුදු දහම පහදා දෙනන්කු ගේ මතක සටහන්

අනගාරික ධර්මපාලතුමා විසිනි
(''ධර්මපාල ප්‍රතිරාවය'' කෘතියෙනි.)

අනගාරිකයකු ගේ හෙවත් නිවාසයක් නැති වන්දනා කරුවකු ගේ කසා වත මා මුලින් ම පෙරවූ දින පටන් ම, ගෘහස්ථ බැමි නැත්තා වූ ශිෂ්‍යයකු වූ දින පටන් ම, ආසියාවේ බෞද්ධ රටවල ද යුරෝපයේ හා ඇමරිකාවේ ද බොහෝ සංචාරයන්හි යෙදීමට සිදුවීම මගේ දෛවය වී ය. බුදුන් වහන්සේ ගේ නිහතමාන අනුගාමිකයකු වශයෙන් මා බටහිරට අවුත් සිටින්නේ, බටහිර වැසියන් බුද්ධාගමට හරවා ගැනීමට නොව, අවුරුදු දෙ දහසකට ද වැඩි කාලයක් තුළ දී, ආසියාවේ ජනතාව ආචාර ධර්ම, කර්මාන්ත හා කලා ශිල්ප අතින් උච්චස්ථාවකට ගෙන ආ ඒ ආගම පිළිබඳ ව යම් කිසි දැනුමක් ගෙන ඒමට ය. පෙර දිග වැසියන් පනස් කෝටියක ගේ ජීවිත කෙරෙහි බල පෑ ආගමක් වුව ද එය බටහිර රටවල අවබෝධ කරගෙන ඇත්තේ සුළු වශයෙනි. එ මෙන් ම, එම රටවල එය පුදුම උපදවන අන්දමින් විකෘති ද කර ඇත. එහෙත් මා එක්සත් ජනපදයට කළ සංචාර සතරේ දී පෙර දිග ඇඳුමෙන් සැරසුණු හෙයින් ආධ්‍යාත්මික සත්‍යයට විරුද්ධ නොවන බොහෝ දෙනෙක් මට මුණ ගැසුණෝ ය.

1903 දෙසැම්බර් මාසයේ දී මා බොස්ටන්හි සිටි අවස්ථාවේ දී මම හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ විලියම් ජේම්ස් ගේ පන්තියකට ගියෙමි. මනෝ විද්‍යාව පිළිබඳ ඒ මහා ආචාර්යවරයා ගේ දේශනයට සවන් දීම සඳහා මම දේශන ශාලාවේ පිටු පසට හිමින් සීරුවේ යෑමට තැත් කළෙමි. එහෙත් කසා වත් හැඳ ගත් අයකුට අමරිකාවේ දී කිසි කෙනෙකු ගේ ඇසට නො පෙනී සිටීම දුෂ්කර ය. මා දුටු මහාචාර්ය ජේම්ස්, මට ශාලාවේ ඉදිරි පසට එන ලෙස සංඥා කළේ ය. ඔහු මෙසේ කී ය. ''මගේ පුටුවේ වාඩි වෙන්න. මම මගේ ශිෂ්‍යයන් සමඟ වාඩි වෙන්නම්. මනෝ විද්‍යාව පිළිබඳ ව දේශනයක් කිරීමට ඔබ මට වඩා දැනුම් තේරුම් ඇත්තෙකි.'' ඉක්බිති ව මා, ඔහු ගේ උසස් පන්තියට බුද්ධ ධර්මයේ ඇතැම් මූලිකාංග විස්තර කර දුන් පසු සිය ශිෂ්‍යයන් වෙතට හැරුණු ඔහු '' අවුරුදු විසි පහකට පසු ව සෑම දෙනා ම ඉගෙන ගන්නා මනෝ විද්‍යාව වන්නේ මෙය යි'' යි පැවසී ය.

බුද්ධාගම හුදු භාව සූචක සිද්ධාන්ත පද්ධතියක් වශයෙන් නො ව, වර්තමාන ලෝකයේ ක්‍රියාකාරී වන ජීවමාන ආගමක් වශයෙන් වඩාත් හොඳින් දැන ගැනීමට අමෙරිකානුවන් උනන්දුවක් දක්වනු ඇතැ යි මට හැඟී යන හෙයින් මගේ ම පෞද්ගලික අත් දැකීම්වලින් ප්‍රයෝජන ගනිමින් මම සිටිමි. මගේ ජීවිතය බුද්ධාගම සමඟ ඉතා හොඳින් බැඳී ඇත. මා බටහිරට ආවේ ක්‍රිස්තියානිය ගැන කිසිවක් නො දැන නොවේ. අවුරුදු විස්සක කාලයක් තිස්සේ මම යළි යළිත් ක්‍රිස්තියානි බයිබලය කියවා ඇත්තෙමි. මම පැරණි බෞද්ධ ලේඛන සමඟ, මා යන යන තැන සමින් බඳනා ලද බයිබලය රැගෙන යමි. නිරන්තර පාවිච්චියෙන් ඉරී යමින් පවතින එහි, බෙහෙවින් ඉරි ගසා සටහන් පිට සටහන් ලියා ඇත. ක්‍රිස්තියානි ආගමත් බුද්ධාගමත් පිළිබඳ ව මා කර ඇති සන්සන්දනය ද සමාන තැන් සොයා ගැනීම් ද දීර්ඝ කාලයක් තිස්සේ ධර්ම ග්‍රන්ථයන්

අධ්‍යයන කිරීමේ ද ආගම් දෙකෙහි දෛනික ඇදහීම් පිළිබඳ නිරීක්ෂණවල ද ප්‍රතිඵල වෙයි.

සිංහල වන්නා වූ මගේ කුල පරම්පරාව අවුරුදු දෙ දහස් දෙසියයක කාලයක සිට අඛණ්ඩ ව ම බෞද්ධ වී ඇත. මම ලංකාවේ අගනුවර වන කොළඹ දී මගේ පරම්පරාගත නිවසේ දී උපත ලද්දෙමි. මගේ මහලු මව එහි තව ම ජීවත් වෙයි. ඉන්දියානු සාගරයේ මන්ද මාරුතයෙන් සසල වූ පොල් අරම් හා කුරුඳු ගසින් ද දෙඩම් ගසින් ද රක්ත වර්ණ හා දම් වර්ණ අශෝක මලින් ද ගිනි ගෙන දැවෙන ගල් මල්වලින් ද යුතු උද්‍යානවලට මුහුණ ලා පිහිටි පුළුල් ආලින්ද ද මගේ ආදි ම මතකයෝ වෙති. දරුවකුට උද්‍යානය චමත්කාර ලෝකයකි. දැවැන්ත මල් මත ගී ගයන කුරුල්ලෝ පියැඹූහ. ගොඩ කැස්බෑවෝ ඉර අවුවෙහි අවුව තැපූ හ. සර්පයෝ පවා පටලැවී ගිය පඳුරු යට ලාලිත්‍ය ගමනින් බඩ ගා ගෙන ගියහ. ජීවත් වන අනෙක් සියලු ම සතුන් මෙන්, සර්පයන් ද බෞද්ධයන් තමන්ට හිංසා පීඩාවක් නොකරන බව දැන ඔවුන් සමඟ ජීවත් වූ බැවිනි.

මගේ පවුලේ සියලු ම දෙනා සැදැහැවත්තු වූහ. මගේ මවට අසාගෙන සිටීමට සූත්‍රවලින් කොටස් ද ගාථා ද කීමට මට සිදු වී තිබිණ. ඒ සත් කාර්යයට පරිත්‍යාගයක් වශයෙන් මගේ මව, මා කැමති රස කැවිල්ලක් සෑම විටක ම සූදානම් කර ගෙන සිටියා ය. මම, මගේ මවට අතිශයින් ම ආදරය ද ගෞරව ද කළෙමි. ක්‍රීඩා කරන අත වාරයේ දී මම බොහෝ විට, ''අනාගත බුදුන් වහන්සේ ගේ කාලයේ දී මගේ මව නිවන් දකිත් වා,''යි මට ම කියා ගතිමි. ඈ යහපත් ද කාරුණික ද පරිත්‍යාගශීලී ද වූවා ය. ඇය ගෙන් ආහාර පාන ඇඳුම් පැළඳුම් ලබා ගැනීම සඳහා සෑම දිනක ම සිඟන ගැහැණු ඇය වෙතට පැමිණියෝ ය. ඇය ගෙන් මට ඇතැම් ගති ගුණ ලැබී තිබේ.

අගහිඟ කම්වලින් මිනිසුන් දුක් විඳිනු මට ඉවසිය නොහැකි ය. දුප්පත් අයට උපකාර කිරීමට මට සැම විට ම වුවමනා වී ය. මගේ මව ගේ සොහොයුරිය ද බටහිර බොහෝ සාත්තු සේවිකාවන් හා සමාජ සේවිකාවන් මෙන්, අනුන් වෙනුවෙන් කැප වූවා ය. දුප්පත් ගැහැණියකට දරුවකු ලැබෙන්නට යන විට පළමුවෙන් ම ඒ ගැන ක්‍රියා කළේ ඇය ය. දරු උපතේ දී උපකාර කළ ඈ, දරුවාට ඇඳුම් පැළඳුම් මිලයට ගෙන දුන්නා ය. අසනීපයක් දුකක් වූයේ කො තැනක ද එ තැන මගේ පුංචි අම්මා, සුර දූතිකාවක මෙන් ඒ ගැන වැඩ කරමින් සිටියා ය. මගේ පියා, සැම බුද්ධිමත් බෞද්ධයකු මෙන්, තමා තමා ගේ විමුක්තිය සලසා ගත යුතු යැ යි සිතී ය. ඔහු සැම විට ම මට මෙ සේ කී ය. ''උඹට ඕනෑ දෙයක් කාපන්, ඕනෑවට වඩා නිදා ගන්න එපා, අන්ධයකු වගේ ඉල්ලන්න එපා, තමා ගේ ම උත්සාහයෙන් ඉගෙන ගනින්.''

මම, මගේ පවුලේ අනෙක් සාමාජිකයන් සමඟ මසකට වරක් පසළොස්වක් පෝය දිනවල උපවාසයෙහි යෙදුණෙමි. විසි හතර පැය භාවනාවෙන් ද බෞද්ධ සූත්‍රවලින් හා අට්ඨ කථාවලින් කොටස් කියවීමෙන් ද ගත කිරීම සඳහා නෑදෑයෝ ද හිත මිතුරෝ ද එ දින එක් රැස් වූහ. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වූයේ එ දින හෙයිනි. අප අවදි වී සුදු වස්ත්‍ර ඇඳ ගෙන, පියා ගේ උයනින් මල් කඩා ගත්තේ පාන්දර හතරට ය. සුවඳ විහිදෙන කහ පැහැති සපු මල් ද දැසමන් මල් ද කඩා ගෙන මගේ දෙමවුපියෝත් ආතා මුත්තලාත් මමත්, අපේ නිවෙස අසල වූ පන්සලට ගොස්, නෙළුම් මල් හා සුදු නා මල් ගොඩ ගැසී තිබුණු බුද්ධ ප්‍රතිමාව ඉදිරියේ එ මල් පූජා කළෙමු. විහාර මන්දිරයේ මඳ ආලෝකයකින් යුත් ඒ කාමරයෙහි දී, භික්ෂූන් වහන්සේලා ගාථා කියත් දී, අපි කාමස්වාදයන් අත හැර දමා සත්‍යයට කැප වීමු. අනාගත උත්පත්තියක දී වඩාත් ආධ්‍යාත්මික වීම සඳහා, අපි මුළු පැ විසි හතර ම සිත පිරිසිදු කර ගැනීමට උත්සාහ දරමින් ගත කළෙමු.

මගේ වයස අවුරුදු හයක් වූ පසු, කොළඹ රෝමානු කතෝලික පාඨශාලාවකට මම යවනු ලැබීමි. යුක්ති යුක්ත අන්දමින් ම, මා බෞද්ධ පාඨශාලාවකට නොයවනු ලැබුයේ මන් ද යි ප්‍රශ්න කළ හැකි ය. එයට හේතුව ලංකාවේ බෞද්ධ පාඨශාලා බලහත්කාරයෙන් වසනු ලැබ තිබීම ය. එසේ වසනු ලැබ තිබුණේ පාඨශාලා පරීක්ෂා කිරීම සඳහා රජය කොමිෂමක් පත් කර තිබීම නිසා ය. බෞද්ධ පාඨශාලාවට ගිය ළමයි, පැරණි සම්ප්‍රදායයන්ට අධික පක්ෂපාති ව සිටියහ. එම නිසා 1870 න් පසු ව සිංහල ළමයින්ට සිය මුතුන් මිත්තන් ලද ආගමික අධ්‍යාපනය නිවෙස්වල දී සිය දෙ මාපියන් ගෙන් ලැබීම විනා, එය ලබා ගැනීමට අන් කිසි මාර්ගයක් නොවූයේ ය. එ පමණක් නොව, ඒ සියල්ලන්ට ම ආගමික නොවන අධ්‍යාපනයක් පවා ලද නොහැකි වී ය. කුමක් නිසා ද යත්, රජයට අවශ්‍ය තරම් පාඨශාලා විවෘත කිරීමට පුළුවන් කමක් නොතිබුණ බැවිනි. තත්ත්වය මෙසේ තිබිය දී, ඒ අඩු පාඩුව පිරවීමට ඉදිරියට ආ ක්‍රිස්තියානි මිෂනාරීහු, දිවයින පුරා නතරවීමක් නොමැති ව පාඨශාලා විවෘත කරන්නට පටන් ගත්හ. තදින් ම මර්දනය කර දමනු ලැබූ සිංහලයන් තුළ මෙයට විරුද්ධත්වයක් දැක්වීමට තරම් ශක්තියක් නොවූයේ ය. එ පමණක් නො ව, සිදු වෙමින් තිබුණේ කුමක් ද යන්න ඔවුන්ට වැටහුණේ ද නැත. අද පවා බෞද්ධයකු පාඨශාලාවක් පිහිටුවීමට උත්සාහයක් කළ හොත්, මිෂනාරීහු මෙ සේ කියති. ''මේ තියෙන්නේ දැනට ම පාඨශාලාවක්. තවත් එකක් මේ දිස්ත්‍රික්කයේ විවෘත කරන්න අවශ්‍යතාවක් නෑ.'' මෙයට රජය මෙසේ තවත් යමක් එකතු කරයි. '' ඔබේ දිස්ත්‍රික්කයේ දැනට ම එක පාඨශාලාවක් තිබෙන බැවින් තවත් පාඨශාලාවක් විවෘත කිරීමට ඉඩ දිය නො හැකි ය.''

එ කල කොළඹ විසූ ඒ පරම්පරාවේ අනෙක් බෞද්ධයන්ට මෙන් ම, මගේ දෙ මවුපියන්ට ද රජයේ හෝ මිෂනාරීන් ගේ

හෝ පාඨශාලාවක් තෝරා ගැනීම හැර කළ හැකි අන් දෙයක් නොවූයේ ය. ඒ අනුව ම, මා මුලින් සඳහන් කළ පරිද්දෙන්, මිෂනාරි පාඨශාලාවකට මා යවනු ලැබූයෙන්, අවුරුදු හයේ සිට දහය දක්වා කාලය තුළ දී දින පතා ම මට කතෝලික පූජකවරුන් ඇසුරු කිරීමට සිදු වූයේ ය. උත්සව දිනවල දී අල්තාර සැරසීමට මගේ පියා ගේ උද්‍යානයෙන් මා මල් ගෙන ආ හෙයින් ද පල්ලියේ නිවාඩු දිනවල පූජාවට මා සෑම විට ම සහභාගි වූ හෙයින් ද මම පාදිලි ගුරුවරුන් ගේ ප්‍රසාදය දිනා ගෙන සිටියෙමි. අපට බොන් බොන් දුන් පාදිලි ගුරුවරු, අපට ආදරය දක්වන බව පෙන්වීමට අප ගේ හිස් අත ගෑහ. ඒ සමඟ ම ඔවුහු සෑම විට ම අපට මෙසේ කීහ. ''ඔබේ මඩ පිළිම දිහා බලන්න. ඔබ වඳින්නේ මැටිවලට.'' මෙහි දී කුඩා බෞද්ධ ළමයා ලජ්ජාවෙන් තම දේශීය ආගමෙන් ඉවත් වෙයි. දරුවන් වශයෙන් සිංහලයෝ යහපත් හා කීකරු වූහ. එ මෙන් ම සිය ගුරුවරුන්ට ආදරය කළහ. ක්‍රිස්තියානි පාදිලිවරුන්ට ඔවුන් කෙරෙහි එ තරම් දැඩි ග්‍රහණයක් තිබුණේ එ බැවිනි. එහෙත් මගේ ගුරුවරුන්ට, මා ගෙදර දී ලද ආගමික පුහුණුවෙන් මා බැහැර කරලීමට නොපුළුවන් වී ය. පාදිලිවරු මහා ඌරු මස් කන්නෝ වූහ. මම මෙසේ සිතීමි: ''ඌරන් කන ජරාව පිළිකුල් ජනක ය. මොවුන් ද ඉතා ජරා අය විය යුතු ය.'' මගේ මිෂනාරි ගුරුන් කෙරෙහි මුල් කාලයේ දී ම මා තුළ පිළිකුලක් ඇති කිරීමට මෙය ප්‍රමාණවත් වී ය. මට නොනැමෙන සුලු අධිෂ්ඨාන ශක්තියක් තිබිණ. මා නොකැමති දෙය මා ලවා කරවීමට කිසි ම ස්වාමියකුට හෝ ගුරුවරයකුට නොපිළිවන් වූයේ ය. එහෙත් කතෝලික බිෂොප් තැන අපේ පාඨශාලාවට ආ විට, මට ඔහු ගේ මුද්ද සිඹින ලෙස දැන්වී ය. එය ප්‍රතික්ෂේප කිරීම හෝ ''ඇයි මම ඔහු ගේ මුද්ද ඉඹින්නේ?'' යි තර්ක කිරීමට හෝ නොහැකි තරම් මම එ කල කුඩා එකෙක් වීමි.

මගේ වයස අවුරුදු එකොළොස වූ විට, නිවෙසින් සැතපුම් හතක් ඈතින් තිබුණු එංගලන්ත සබාවේ බෝඩිං පාඨශාලාවකට මම යවනු ලැබීමි. මා එහි ගත කළ අවුරුදු දෙක හමාර තුළ දී ඒ වෙනුවට උදේ සිට සවස් වන තුරු බයිබල් පාඩම් මට පොවන ලද්දේ ය. ඒ මිෂනාරීහු සැඟවීමක් නොමැති ව ම මෙසේ කීහ. ''අපි ආවේ උඹලාට ඉංග්‍රීසි උගන්වන්න නොවෙයි. ක්‍රිස්තු ධර්මය උගන්වන්න යි.''

මේ පාඨශාලාවේ මා සිටිත් දී එක් දිනෙක - එවකට මගේ වයස අවුරුදු දෙළසක් වීය. මගේ ගුරුවරුන් ගෙන් කෙනකු කුඹුර දිසාවට තුවක්කුවක් ද රැගෙන ගොස් කුරුල්ලකු වෙඩි තබා මරනු මම දිටිමි. මම මෙහි දී හයින් භ්‍රාන්ත වී ගියෙමි. මම එ විට මට ම මෙසේ කියා ගතිමි. ඒ කාලයේ දී මම බයිබලය දිනකට සතර වරක් කියවමින් සිටියෙමි. ''මේ මට සුදුසු ආගමක් නොවේ. ඔහු ක්‍රිස්තියානි ආගම දේශනා කරන්නෙකි. එ බඳු ඔහු අනුකම්පා විරහිත ව අසරණ කුරුල්ලන් මරා දමයි.'' ඒ පාඨශාලාවේ ගුරුවරු මත් පැන් ද පානය කළහ. එය මගේ මුල් කාලීන සියලු ම ඉගැන්වීම්වලට විරුද්ධ ය. මෙයට වැඩි කලක් යන්නට මත්තෙන් මගේ පන්තියේ කුඩා ළමයෙක් මිය ගියේ ය. ඇඳේ නිසල ව වැතිර සිටි ඔහු දෙස බලමින් අප සිටිය දී, අප ගේ ගුරුවරයා අපට යාච්ඤා කිරීමට කී ය. අප යාච්ඤා කළේ බිය නිසා බව හදිසියේ ම මට වැටහී ගියේ ය. ඒ මොහොතේ පටන් චින්තනයේ නිදහස මා තුළ උදා වුයේ ය. මම යාච්ඤා කිරීම නතර කළෙමි. වැඩි කලක් යන්නට පෙර මම බයිබලය තදින් විවේචනය කරන්නෙක් වීමි.

මේ මුළු කාලය තුළ දී ම, මම නිවසෙහි දීත් පන්සලේ දීත් භික්ෂූන් වහන්සේලා ඇසුරු කළෙමි. භික්ෂූන් වහන්සේ කෙනෙක් යනු බුදුන් වහන්සේ ගේ උසස් ඉගැන්වීම් අනුගමනය කරන්නා වූ ද දශ ශීල ව්‍රත සමාදන් වන්නා වූ ද තැනැත්තෙකි.

දෙ මවුපියන් ගේ අවසර ඇති ව කෙනකුට ආරාමික ජීවිතයට ඇතුළු විය හැකි ය. සොල්දාදුවකුට සිය අණ දෙන නිලධාරියා ගේ අවසර ඇති ව ඇතුළු විය හැකි ය. ඔහු බෝවන රෝගවලින් මිදී සිටි අයකු විය යුතු ය. දශ ශීල නම් : පර පණ නොනැසීම, සොර කම් නොකිරීම, බ්‍රහ්මචාරී ව විසීම, සත්‍යය කථා කිරීම, මත් පැන් පානය නොකිරීම, විකාල භෝජනයෙන් වෙන් වීම (දහවල් ආහාරයෙන් පසු ගන ආහාර ගැනීම භික්ෂූන්ට තහනම්) නෘත්‍ය ගීත වාදන විසූක දස්සනවලින් වෙන් වීම, ආභරණ සුවඳ විලවුන් පාවිච්චි නොකිරීම, උච්චා සයන මහා සයනවලින් වෙන් වීම සහ මිල මුදල් නොපිළිගැනීම ය. විනයත් ඇඳුමත් ආහාරයත් පිළිබඳ අමතර නීති ද ඇත. අනෙක් කරුණු අතින් හොඳින් ශීලාදිය එකී නම්, ඕනෑ ම මාර්ගයකින් ආධ්‍යාත්මික අරමුණ සාක්ෂාත් කර ගැනීමට භික්ෂූන් වහන්සේට නිදහස ඇත.

වයින් පානය කරන්නා වූ ද මස් අනුභව කරන්නා වූ ද විනෝද ප්‍රිය වූ ද මගේ ගුරුවරුන්ට හාත්පසින් වෙනස් අන්දමින්, භික්ෂූන් වහන්සේලා නිහතමාන වූ ද මිතාහාර හා මිතාචාර ඇත්තා වූ කොටසක් වූහ. උන් වහන්සේලා ගේ සමාගම ප්‍රිය කළ මම, ශාන්ත අන්දමින් මුල්ලකින් වාඩි වී, මට වටහා ගැනීමට නොහැකි තරම් ගැටළු සහිත වුව ද උන් වහන්සේලා ගේ නුවණැති දේශනවලට සවන් දිනිමි. ශ්‍රී පාද ස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වූ ඉතා ම උගත්, කා ගේත් ආදරයට ලක් වූ ගෞරවාර්හ හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමීපාදයාණන් වහන්සේ උන් වහන්සේ අපවත් වූ 1911 දක්වා මට ඇසුරු කරන්නට ලැබීම මගේ වාසනාවකි. සෑදැහැවත් බෞද්ධයෝ ශත වර්ෂ ගණනාවක් තිස්සේ ශ්‍රී පාද ස්ථානයට වන්දනා ගමන් යති. බුද්ධාගම හා පාලි භාෂාව අධ්‍යයනය කිරීම සඳහා ලංකාවේ ඇති ප්‍රධානතම ආයතනය වන, කොළඹ විද්‍යෝදය පිරිවෙණේ ආදි කර්තෘන් වහන්සේ සහ අධිපතීන් වහන්සේ ද උන් වහන්සේ ය. මගේ පවුලේ මිත්‍රයකු වශයෙන්

දිනපතා ම වාගේ මා දුටු තවත් භික්ෂූන් වහන්සේ නමක් නම්, මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණන් ය. වාදීභසිංහයෙකු වූ උන්වහන්සේ ප්‍රතාපවත් පෞරුෂයකින් හෙබි සේක. බුද්ධාගමට පහර දුන් ක්‍රිස්තියානීන්ට උන් වහන්සේ පිළිතුරු දෙන්නට පටන් ගත් විට, උන්වහන්සේ ගේ කීර්තිය දිවයින පුරාම විහිදෙන්නට පටන් ගත්තේ ය. උන් වහන්සේ කථා කළ සෑම තැනකට ම මහ පිරිස් ඇදී ආහ. වාද ගණනාවක දී ම උන් වහන්සේ ක්‍රිස්තියානීන් පැරදවූහ. මගේ වයස අවුරුදු දහය කාලයේ දී මම නිවසින් සැතපුම් දහයක් ඈතින් පිහිටි පන්සල් මණ්ඩපයක පැවැත්වූ මහා වාදයක් බැලීමට ගියෙමි. ක්‍රිස්තියානීහු එක් පැත්තකත් ගුණානන්ද හිමියෝ අනෙක් පැත්තෙත් වාඩි වී, තම තමන් ගේ ආගම් පිළිබඳ සත්‍යයන් ගැන වාද කළහ. මේ සුප්‍රසිද්ධ වාදය ඇසීම සඳහා දිවයිනේ ඉතා ඈත පළාත්වලින් පවා දහස් ගණන් ජනයා පොල් අතුවලින් වට කරන ලද රෝද දෙකේ ගොන් කරත්තවලින් ද සැහැල්ලු තිරික්කලවලින් ද පයින් ද එ තැනට පැමිණියෝ ය. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ වාද කළහ. ගෞරවාර්හ සුමංගල හිමියෝ ගුණානන්ද හිමියන්ට අවශ්‍ය ශාස්ත්‍රීය කරුණු සපයා දුන්හ. මේ වාදය මුළු මනින් ම දින තුනක් පැවතිණ.

මේ කාලයේ දී කොළඹට පැමිණ සිටි අමෙරිකානු අධ්‍යාත්මවාදියකු වූ ආචාර්ය ජේ. එම්. පීබල්ස්, බෞද්ධයන් හා ක්‍රිස්තියානීන් අතර පැවති වාදයේ ඉංග්‍රිසි වාර්තාවක් ලබා ගෙන, ආපසු අමෙරිකාවට ගොස් එය සෙන්පති හෙන්රි එස්. ඕල්කට් මහතාට ද එච්. පී. බ්ලැවට්ස්කි මැතිනියට ද පෙන්වී ය. ඔවුන් 1875 දී නිව්යෝක් නගරයේ පරම විඥානාර්ථ සමාගම සංවිධානය කර තිබිණ. වාදය පිළිබඳ වාර්තාව ඔවුන් ගේ සිත තරයේ ඇද ගත්තෙන්, සුමංගල හිමියන්ට හා ගුණානන්ද හිමියන්ට ලියූ ඔවුහු විශ්ව සහෝදරත්වයේ නාමයෙන් පෙර දිග දර්ශනවලින් ආභාසය ලැබ සමාගමක් ආරම්භ කළ බව ද

බෞද්ධයන්ට ආධාර දෙනු සඳහා ලංකාවට එන බව ද දැන්වූහ. සෙන්පති ඕල්කට් තුමා ගේ ද බ්ලැවට්ස්කි මැතිණිය ගේ ද ලියුම් සිංහලයට පරිවර්තනය කරනු ලැබ පෘථුල වශයෙන් විසුරුවා හරිනු ලැබිණ. ඉතා ඈත සිටිය ද එ තරම් අනුකම්පා සහගත මේ අමුත්තන් දෙ දෙනා වෙනුවෙන් මගේ හදවත උණුසුම් වී ගියෙන්, ඔවුන් ලංකාවට පැමිණියාට පසු ව, ඔවුන් හා එක් වීමට මම තීරණය කර ගතිමි.

අවුරුදු කීපයකට පසු ව ඔවුහු ඇත්ත වශයෙන් ම ලංකාවට පැමිණියෝ ය. එ විට මගේ වයස අවුරුදු දහ සයක් වී ය. බෞද්ධයෝ ඔවුන්ට රාජකීය අන්දමින් සැලකූහ. ඔවුන් පිළිගැනීමට මා ගිය සැටි මට මතක ය. ඔවුන් ගේ අත් මා ස්පර්ශ කළ කෙණෙහි ම, මට මහා සන්තෝෂයක් පහළ වී ය. විශ්ව සහෝදරත්වයක් සඳහා වූ අභිලාෂය ද මානව වර්ගයා උදෙසා ඔවුන්ට ඉටු කිරීමට වුව මනා කළ සියලු ම දේ ද, මා තුළ ඊට අනුකූල හැඟීමක් පහළ කළේ ය. ඔවුන් ගේ සඟරාව කියවීමට මම පටන් ගතිමි. මේ කාලයේ දීත් මම පාසල් යමින් සිටියෙමි. සාමාන්‍ය පාසල් දරුවා ප්‍රිය කළ කෙළි සෙල්ලම් හා විනෝදාංශ වෙනුවට, අවශ්‍ය සෑම දෙයක් ම තිබුණා වූ ද ස්වාධීන වූ ද මම, හුදෙකලා භාවයටත් මල්වලටත් සුන්දර දර්ශනවලටත් ප්‍රිය කළෙමි. සුවඳ වහනය වන ගස්වලින් හෙවී වැවී ගිය උයනේ සක්මන් කරන විට ද නැත හොත් තේක්ක ගස්වලින් හා පොල් ගස්වලින් සෙවණ වුණු මුහුදු වෙරළේ ඇවිදින විට ද පරම විඥනාර්ථීන් දෙ දෙනා සමඟ මා කළ සාකච්ඡා ගැන මම කල්පනා කළෙමි.

ලබන කලාපයට........



# වෙසක් සඳ

එද නිල් අහස් කුස
පිරිවරා තරු කැට
බලා සිටියෙමි මම
කිමැයි මේ අසිරිය

දසත සීතල සුළඟෙ
විසුරුණා මල් සුවඳ
ඒ අසිරිමත් කුමරු
බිහිවුණා මේ ලොවට

තවත් එක් සැඳෑවක
ඉකිබිඳින අහස් කුස
වලාකුළු මෑත් කර
එබී බලනා කලට
දුටිමි ඒ මහසතුන්
කරනු මහ'බිනික්මන්
එද සිට ස වසක් ම
බලා සිටියෙමි මේ මම
දෙමින් සඳ රැස් කිරණ

වඩන වීරිය දිහා
මල් පිපී සුවඳ දී
විහඟ ගී පද බඳී
ලොවේ මහ අසිරියකි
කිමැයි මේ මහ අරුම!

ඒ මහාසත් තුමන්
විශ්වය ම ජය අරන්
පුරා පන්සාළිස් වසක්
අහස් කුස පුරාවට
රැඳී සිටියෙමි මෙ මම්
හිමි වඩින දෙස බලා
ගහ කොළත් මැලවිලා
මලුත් මුකුලිත වෙලා
විහඟ ගී ගොළු වෙලා
කිමැයි මේ නිහඬ බව
විශ්වය ම ගොළු වෙලා
අනේ මගෙ බුදු සමිඳු
පිරිනිවනෙ සැතපිලා .....

පුෂ්පා ජයවර්ධන මහාත්මනිය
ගරු ලේකම් - සාසන සාවිකා සමිතිය



# අධිෂ්ඨානය

**සිරි වජිරාරාමවාසී**
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි**

පුංචි දුවේ පුතේ, අපේ සිතට නොයෙකුත් චිත්ත ආවේග ගලා එනවා. සිතට සිතුවිලි ඒම සමහර විටෙක තොරතෝංචියක් නැතිව ම සිදුවෙනවා. අපේ හිත දිහා හොඳින් අවධානයෙන් යුතුව බලා සිටිනවිට අපට මේ ස්වභාවය තේරුම් ගන්නට පුළුවන්. ඔබත් විටෙක උත්සාහ කර බලන්න. ඔබටත් මේ ක්‍රියාව කරන්න පුළුවන් ද කියා.

ඔය අතර තුරේ මම මාගේ අදහස් මුදුන් පත් කරගන්නවා කියන සිතුවිල්ලත් හිතට එනවා. මේ සිතුවිල්ල බොහෝ ම ප්‍රබල සිතුවිල්ලක්. මෙයට සමහර තැනකදී අපට අධිෂ්ඨානය කියලා හඳුන්වන්නත් පුළුවන්.

අප කැමති දේ ඒ අයුරින් ඉෂ්ට සිද්ධ කරදෙන දෙවියා හැටියට අධිෂ්ඨානය හඳුන්වන්න පුළුවනි. ඒත් බලවත් වූ අදිටනින් යුතු ව අප සපුරා ගන්නේ මොන වාගේ කරුණු කාරණා ද කියල අප බුද්ධිමත්ව සිතා බලන්නට ඕනේ. අපට අපේ ජීවිතයට යහපත් දේවල් වගේ ම අයහපත් දේවල් පවා එකතු කරගන්නට පුළුවන්. වඩාත්ම පහසු අපේ ජීවිතයට අයහපත් දේවල් එකතු කර ගන්නයි. කිසිදු හිරිහැර පීඩාවකින්

තොර ව සමහර විටෙක අයහපත් දේ අපේ ජීවිතවලට එක් කරගන්නට හැකි ය. සමහර විටෙක අධිෂ්ඨානයෙන් යුතුව අප යොමුවන්නේ අපේ ජීවිතයට අයහපත් දේ එකතු කරගන්නයි. එසේ යම් විටෙක ඔබ සිදු කළොත් ඔබ සිතට වහල් වී තමයි ක්‍රියා කරල තිබෙන්නේ. එවිට ඔබ අන්ධකාරයෙන් අන්ධකාරයට ම යි ගමන් කරන්නේ.

අධිෂ්ඨානය පවා නිවැරදි දේ උදෙසා යොදවා ගත්තොත් අපට හැකියාව තියෙනවා දැන් අප සිටින මට්ටමෙන් වඩා ඉහළ තත්ත්වයකට පත් වෙන්න. එය හරියට අන්ධකාරයෙන් ආලෝකයට යෑම වැනි ය.

පුංචි කාලේ ඉඳලම ඉගෙනීම ද ධනය ද යහපත් චරිතය ද අධිෂ්ඨාන ශක්තියෙන් නිවැරදි ව ම ලබා ගත යුතු ය. ඒ සඳහා ඔබ යම් වැඩක නියුතු වෙනවාද ඒ වැඩය සම්පූර්ණව යහපත් ව හරියාකාරව හොඳින් සිද්ධ කළ යුතු ය. ඒ සඳහා මේ අදිටන හොඳට සිතේ ධාරණය කරගන්න. " මම මට අයත් වැඩ කොටස කොහොම නමුත් නිවැරදි ව යහපත් ව සිදු කරමි ".

දැන් විවේක මනසකින් යුතුව පොඩ්ඩක් කල්පනා කරල බලන්න. පංති කාමරයේ දී, නිවසේ දී ඔබට පැවරෙන සියලු වැඩ හොඳින් යහපත් ව සම්පූර්ණ කරනවා ද කියා. එසේ ම ඒ වැඩ සිදුකරන විට දවසින් දවස ඔබේ ගතිගුණ යහපත් වෙනවාද? මෙන්න මේ ප්‍රශ්න හමුවේ අවංක ව ඔබට දිය හැකි පිළිතුර ''ඔව්' යන්න නම් ඔබ සැබැවින් ම අධිෂ්ඨානයෙන් යුතු අයෙකි.

එසේ නොමැති නම් අද අද ම වැර වඩා මේ උතුම් ගුණය පුංචි ඔබේ ජීවිතයට එකතු කරගන්න උත්සාහ කරන්න.

පුංචි ඔබට තෙරුවන් සරණයි !



# මෙහෙමයි හොඳ ළමයින් බබළන්නේ

ජයන්තා ජයසේකර නැන්ද
(තරුණ සීල සමාදනය,
සිරි වජිරඤාණ ධර්මායතනය, මහරගම)

සිත පිරිසිදු වෙයි බුදුන් වඳින විට
එය ම හේතු වෙයි නිරෝගී වෙන්නට
දිනපතා ම පින් සිදු කර ගන්නට
පන්සිල් රැකුමෙන් හැකිවෙයි ඔබ හට

සතුන් මරන්නට එපා දරුවනේ
අනුන්ගෙ දේ මොකට ද අරගන්නේ
විහිළුවටත් බොරු නොකියා ඉන්නේ
එවිට යි ඔබ හොඳ ළමයකු වෙන්නේ

බුදු සමිඳුන් පොඩි ඔබ ගැන සිතුවා
උතුමන් නමඳින පිළිවෙත දෙසුවා
දෙදණ දෙඅත නළල ද බිම ගාවා
හොඳට වඳින්නැයි හිමි බණ දෙසුවා

යහපත් ගුණ ඇති දරුවන් වෙන්නට
බුදුබණ කියලා දෙන සඟ රුවනට
ගරු කළ යුතුවෙයි පින් ලැබ ගන්නට
පසඟ පිහිටුවා වඳින්න හැම විට

සුදු ඇඳුමයි පන්සලට අඳින්නේ
තොප්පි සපත්තුත් නැහැ පළඳින්නේ
සද්ද නොකර හෙමිහිට ඇවිදින්නේ
හොඳ දරුවා එලෙස ම හැසිරෙන්නේ